ගෘහාශ්‍රිතව බහුලව භාවිතා වන රසායනික ප්‍රතිකාරක සඳහා විකල්ප භාවිතා කිරීමෙන් රසායනික අපවිත්‍රනය ඇතිවිය හැක. මේ සඳහා,

- වායු පවිත්‍රකාරක වෙනුවට වාතාශ්‍රය ලැබීම සඳහා ජනෙල් පියන් විවෘත කර තැබීම, වාතය සුවඳවත් කිරීම සඳහා සැවැන්දරා, පුළුන්වල පෙඟවූ පවිත්‍ර වැනිලා, මද ගින්නේ තැම්බූ කුරුඳු හෝ කරාබු නැටි භාවිතා කල හැක.
- පවිත්‍රකාරක වෙනුවට බේකින් සෝඩා කෝප්ප 2/3 කට ඇමෝනියා කෝප්ප 1/4 ක් සහ විනාකිරි කෝප්ප 1/4 ක් උණුවතුර ගැලුමකට දමා මිශ්‍රකර භාවිතා කල හැක.
- පිත්තල ඔප දැමීමට විනාකිරි, ලුණු සහ පාන්පිටි එක පමණ ගෙන සාදාගත් පල්පයක් භාවිතා කල හැක. පවිත්‍ර කිරීමෙන් පසු සම්පූර්ණයෙන්ම සෝදා ඉවත් කල යුතුය. නැතහොත් මල බැඳීම සිදුවේ.
- ඉඳුල් භාජන පවිත්‍ර කිරීමට දියර සබන් හෝ මෘදු ක්ෂාලකයක් භාවිතා කර ජලයෙන් සේදීම කල හැක.
- රෙදිපිලි මෘදුකාරක (softeners) වෙනුවට සේදීමේදි බේකින් සෝඩා කෝප්ප 1/4 ක් හෝ 1/2 සේදුම් ජලයට එක්කල හැක.
- කෘතිම පොහොර වෙනුවට කොම්පොස්ට් හෝ වෙනත් කාබනික පොහොරක් භාවිතා කල හැක. මුළුතැන්ගෙ යින් ඉවතලන දිරාපත්වන ද්‍රව්‍ය හා ගෙමිදුලේ එක්වන කොළරොඩු යොදා ගනිමින් නිවසේදීම කොම්පෝස්ට් පොහොර සාදා ගත හැක.
- භූමි පවිත්‍රකාරක සඳහා ජලය ගැලුම් 2 කට විනාකිරි කෝප්ප 1 ක් දමා භාවිතා කල හැක.
- නිමා නොකරන ලද පොළවක් සඳහා හණ ඇට වලින් නිස්සාරණය කල තෙල් කොප්ප 1 ක් ඉහත මිශ්‍රණයට එක් කරන්න.
- තෙල් පැල්ලම් ඉවත් කිරීමට සෝඩා වතුර යොදා මද වේලාවක් තබා පිස දමන්න.
- භූමි ආලේපනය සඳහා සෝඩා ජලය යොදා භූමි ආලේපනය කල හැක.
- දැව භාණ්ඩ වල ආලේපනයට ඛණිජ තෙල් (mineral oil) පයින්ට් 1 කට ලෙමන් තෙල් (lemon oil) තේ හැඳි 1 ක් දමා භාවිතා කල හැක.
- වැසිකිලි පවිත්‍රකාරක, බේකින් සෝඩා හෝ මෘදුක්ෂාලක යොදා බුරුසුවකින් පවිත්‍ර කල හැක.
- ජනෙල් පවිත්‍රකාරක සඳහා ජලය ගැලුම් 1/4 කට ඇමෝනියා කෝප්ප 1/4 ක් මිශ්‍ර කරන්න.
- තෙල් පදනම්වූ තිනර් වෙනුවට ජලය පදනම්වූ නිෂ්පාදන භාවිතා කල හැක.

විෂ රසායනික ද්‍රව්‍යවලට නිරාවරණය වීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල පහත හේතූන් මත රදා පවතී.

i. රසායනික ද්‍රව්‍යයේ ප්‍රහලත්වය මත (ධූලකතාවය)
ii. අනාවෘතවූ මාර්ගය - සම හරහා, අධිග්‍රහණයෙන්, ආශ්වාසයෙන්
iii. අනාවර්තවූ කාළය - දින, මාස, වසර

## ඇතිවිය හැකි අහිතකර බලපෑම්

1. විෂ රසායනික ද්‍රව්‍යයකට එක්වරම නිරාවරණය වීම මගින්
   - උගුර, නාසයේ, සමෙහි, අත්වල ඇතිවන කැසීම්
   - ස්වසන ආබාධ
   - පිලිස්සුම් තුවාල
   - වමනය (ඔක්කාරය) කෑම අරුචිය ඇතිවිය හැක
2. දීර්ඝකාලීනව නිරාවරණය වීම නිසා
   - පිළිකා වැනි රෝග තත්ත්වයන්
   - වකුගඩු, අක්මාව, වැනි ජීවත් වීමට අත්‍යවශ්‍ය අවයව ආශ්‍රිත රෝගාබාධ ඇති වීම.
   - මතක ශක්තිය අඩුවීම
   - සමෙහි, ඇස්වල විකෘතින් ඇති වීම.
   - දේහබර අඩුවීම දැකිය හැක



මෙවැනි රසායනික සංයෝග අඩංගු නිෂ්පාදනයන් මිලදී ගැනීමට පෙර එහි සෞඛ්‍යයට අහිතකර මෙන්ම පරිසරයට අහිතකර සංයෝග අඩංගුද යන්න පරීක්ෂා කර බලා එවන් සංයෝග අඩංගු නිෂ්පාදන මිලදී ගැනීමෙන් හැකිතාක් වැලකීම මගින් ඔබගේ මෙන්ම පරිසරයේ ද යහපැවැත්මට මහඟු පිටුවහලක් වේ.

මූල්‍ය අනුග්‍රහය
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ
ජගත් පාරිසරික පහසුකම් සුළු මූල්‍යාධාර වැඩසටහන

# නිවසේ සිදුවිය හැකි රසායනික අපවිත්‍රනය වලක්වා ගනිමු



පරිසර යුක්ති කේන්ද්‍රය
20/A, කුරුප්පු පාර, කොළඹ 08.
දුරකථන: ++94-11-2683282
email: info@ejustice.lk web: www.ejustice.lk

*SAICM NGO focal point of Sri Lanka*

## නිවසේදී එදිනෙදා භාවිතා වන රසායනික ද්‍රව්‍ය

නිවසේ එදිනෙදා කටයුතු පහසුකර ගැනීම සඳහා විවිධ ආකාරයේ රසායනික සංයෝග අඩංගු නිෂ්පාදිතයන් යොදා ගැනීම සිදුකරයි. මෙම නිෂ්පාදිතයන් ඝණමය, ද්‍රවමය හෝ වායුමය ආකාරයෙන් පාරිභෝගික ජනතාව අතට පත්වේ. එකිනෙකට වෙනස් වූ භෞතික හා රසායනික ගුණවලින් සමන්විත මෙවැනි සංයෝග බොහෝමයක් මිනිසා විසින් කෘතිමව නිෂ්පාදනය කල සංයෝග යන් වේ. මෙම කෘතිම නිෂ්පාදන අතරෙහි ඇතැම් විට ස්වභාවිකව නිස්සාරණය කරන ලද රසායනික සංයෝගද ඇතුලත්ව පවතී.

කෘතිමව නිෂ්පාදනය කරන ලද බොහෝ රසායනික ද්‍රව්‍ය මිනිසාගේ සෞඛ්‍යයට මෙන්ම පරිසරයටද අහිතකර ලෙස බලපායි. මෙවැනි රසායනික ද්‍රව්‍ය “විෂ රසායනික ද්‍රව්‍ය”ලෙස හඳුන්වනු ලැබේ. විෂ රසායනික ද්‍රව්‍ය අපරීක්ෂාකාරීව භාවිතයෙන් හා අපරීක්ෂාකාරී ලෙස ඉවත දැමීම නිසා සෞඛ්‍ය ගැටලු රාශියකට මුහුණ දීමට සිදුවී තිබේ.

## විෂ රසායනික ද්‍රව්‍ය අඩංගු විවිධවූ නිෂ්පාදනයන්

**ගෙතුල භාවිතා කරන ද්‍රව්‍ය:**

- තීන්ත තුනීකාරක (Thinner), දිලිසුම්කාරක (Varnish)
- පිරිසිදු කාරක, විරංජක කාරක, පැල්ලම් ඉවත් කරන ද්‍රව්‍ය, විෂබීජ නාශක
- තෙලහාරකයන් (Surfactants)
- පොලිෂ් වර්ග
- විවිධ වූ කෘමිනාශක වර්ග
- මදුරු කොයිල්

**විදුලි උපකරණ**

- ප්‍රතිදීප්ත පහන්




**ගෙවතු නිෂ්පාදන**

- ලී සංරක්ෂක
- කෘමිනාශක
- වල්නාශක
- පොහොර වර්ග
- දිලීරනාශක

**රථවාහන සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය**

- පෙට්‍රල්/ඩීසල්
- එන්ජින්වලට යොදාගන්නා තෙල් වර්ග
- බැටරි වර්ග

## ඔබ (යොදා ගන්නා) භාවිතා කරන නිෂ්පාදිතවල විෂ රසායනික ද්‍රව්‍ය අඩංගු වේ දැයි දැන ගන්නේ කෙසේද?

**පහත ලකුණු මගින් රසායනිකයේ විෂ ස්වභාවය විස්තර කෙරේ.**



ගිනි ඇවිලෙන සුලුයි (flammable)



විෂ සහිතයි ( toxic)



ඔක්සිකාරක (oxidizing)



පුපුරන සුලුයි (explosive)



විඛාදනශීලී (corrosive)



පරිසරයට අහිතකරයි (environmental hazard)

## රසායනික ද්‍රව්‍ය භාවිතා කරන්නේ කෙසේද?

1 කිසිම ආකාරයකින් විෂ රසායනික ද්‍රව්‍ය ආහාරපාන අතර ගබඩා කිරීම මෙන්ම ආහාරපාන ගබඩා කිරීමට යොදා ගන්නා බහාලුම්වල ගබඩා කිරීමෙන් වැලකිය යුතුය.

2 ගබඩා කිරීමකදී සෘජු හිරු එළිය නොවැටෙන ස්ථානයක ගබඩා කිරීම මගින් සිදුවිය හැකි පිපිරීම් වැනි අනතුරු වළක්වා ගත හැක.

3 එකිනෙකට වෙනස් රසායනික ද්‍රව්‍ය මිශ්‍රකිරීම නිසා ඇතිවන ප්‍රතික්‍රියාවේ ප්‍රබලත්වය මත ගිනි ගැනීම්, පිපිරීම් සිදුවිය හැක. එම නිසා කිසිම විටක උපදෙස් නොමැතිව රසායනික ද්‍රව්‍ය 2ක් මිශ්‍ර කිරීමෙන් වළකින්න.

4 සැමවිටම දරුවන්ට ලගා නොවිය හැකි පරිදි ගබඩා කිරීමට වගබලා ගත යුතුය/ලේබල් කල යුතුය.

5 ලේබලයේ ඇති උපදෙස් හොඳින් කියවීම මගින් රසායනික ද්‍රව්‍ය නිසා ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල අවම කරගත හැක. නියමිත මාත්‍රාව පිලිපැදීමද ඉතා වැදගත් වේ.

6 ඇතැම් රසායනික ද්‍රව්‍ය වාෂ්පශීලී ද්‍රව්‍යවලින් සමන්විත අතර එමනිසා භාවිතා කරන විටදී මෙම වාෂ්පශීලී ද්‍රව්‍ය ආඝ්‍රහනය විය හැක. එවැනි රසායනික ද්‍රව්‍ය භාවිතයේදී මුඛ ආවරණ පැලදීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස සැලකේ.

7 එමෙන්ම වාෂ්පශීලී රසායනික ද්‍රව්‍ය භාවිත කිරීමෙන් පසු එම ස්ථානයට හොඳින් වාත්‍රාශ්‍රය ලැබීමට සැලැස්වීම මගින් රසායනික ද්‍රව්‍යයේ සාන්ද්‍රණය අවම කරගත හැක.

8 ආහාරපාන අනුභව කරමින් රසායනික ද්‍රව්‍ය භාවිත කිරීමේදී ආහාර සමග රසායනික ද්‍රව්‍ය ශරීරගත හැකිවිය නිසා රසායනික ද්‍රව්‍ය භාවිත කරන විට ආහාර නොගැනීම හා රසායනික ද්‍රව්‍ය භාවිත කිරීමෙන් පසු හොඳින් පිරිසිදු වීම කල යුතුය.

9 ගැබිණි මවුවරුන් හා ළදරුවන් සිටින විටදී විෂ රසායනික ද්‍රව්‍ය භාවිතය නොකල යුතුය.

10 රසායනික ද්‍රව්‍යයක් නොදැනුවත් කමින් ශරීරගතවූ විට හා පිලිස්සුම් තුවාල, කැසීම්, අසාත්මිකතා ඇතිවූ විට හැකිතාක් ඉක්මණින් වෛද්‍යවරයෙකු වෙත යොමුවිය යුතුය.

